**කුරුණෑගල මහා නගර සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 08 ක වටිනාකම් තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවියයුතු රු.50,229,595 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළ විගණන ගාස්තු ඌණ වෙන් කිරීම් රු.65,800 කට අදාළ ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.82,695,481 ක් වූ ජල ආදායම් බිල් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල රු.79,215,994 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාල ණයගිම් අතිරික්ත වෙන් කිරීම් කපා හැරීම් රු.440,999 ක් අඩුවෙන් සටහන් වීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේදී දෙපාර්තමේන්තු 02 කට අයත් කර්මාන්ත 06 ක රු.5,786,078 ක් වූ ණයගිම් වෙන්කිරීම් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කිරීම් හෝ කපා හැරීම් සිදුකර නොතිබුණු නමුත්, වර්ෂය අවසානයට වූ ණයගිම් ශේෂයට ඇතුලත් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්වලට එළඹ නොතිබුණු කර්මාන්ත 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල රු.5,297,022 ක ණයගිම් වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු ජල හා විදුලි ගාස්තු රු.5,167,484 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට කලින් ලද වෙනත් ආදායම් රු.77,549 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.341,033 ක් ලෙස දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණු රු.260,004 ක කලින් ලැබීම් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2018 වර්ෂයේ දී මිලදීගෙන තිබුණු රු.1,087,428 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ රු.11,458,360 ක් වූ එකතු කළ අගය මත බදු, වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ක) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු රු.4,929,856 ක් වූ එකතු කළ අගය මත බදු ගිණුම්ගත කර නොතිබුණි.

(ග) අය විෂයය 50352 ට අදාළ දඩ මුදල් සඳහා වර්ෂයේ බිල් කිරීම් රු.76,187 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ එය රු.212,920 ක අවාසිදායක අගයක් ලෙස දක්වා තිබුණි.

(ච) බැංකු දෙකක ස්ථාවර තැන්පත් මත රු.1,339,829 ක පොලිය වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 19 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල ශේෂයන් අතර රු.40,690,030 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ සාරාංශ ආදායම් විශ්ලේෂණය හා කාණ්ඩ එකතු ලේඛනය අතර රු.1,410,574 ක නොසැසඳීම් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.81,672,021 ක් වූ ණයහිමි ශේෂයට වර්ෂය තුළ ණයහිමි ගෙවීම් හා කපා හැරීම් එකතුව රු.84,984,660 ක් වූයෙන් රු.3,312,639 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.211,450,043 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ වලින් වර්ෂ 01 ක් ඉක්මවා තිබුණු රු.37,253,164 ක ශේෂ අයකරගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.150,205,485 ක් වූ ගෙවිය යුතු ගිණුම්වලින් වර්ෂ 01 ක් ඉක්මවා තිබුණු රු.46,924,564 ක ශේෂ නිරවුල් කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.**

-----------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.370,192,935 ක් වූ ගිණුම් විෂයයන් 26 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XXIV පරිච්ඡේදයේ 3.7 ඡේදය | 1,200,00 | නිලධාරීන් 12 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබුණු ආපදා ණයවල වාරික සහ පොලී අයකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ.135 | - | එක් එක් ගණුදෙනු, නිලධාරීන් කිහිප දෙනෙකු මාර්ගයෙන් පරීක්ෂණයට භාජනය වන පරිදි රාජකාරි බෙදා නියම කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 177 (1) | 107,231 | ක්ෂේත්‍රයේදී එකතු කර ගන්නා ලද මුදල් දිනපතා හෝ ප්‍රමාදයකින් තොරව මුදල් භාරකරුට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (iii) | මු.රෙ.189 | 750,305 | වර්ෂ 01 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට නිරවුල් වී නොතිබුණු අගරු චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ.384 (3) | - | සභාවට ලැබෙන චෙක්පත් පිළිබඳ විස්තර සටහන් කිරීමට ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (v) | මු.රෙ.396 (ඈ) | 59,874 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (vi) | මු.රෙ. 571 (2) | 9,288,051 | තැන්පත් කර වර්ෂ 02 ක කාලයක් ඉක්මවූ තැන්පතු 22 ක් සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| | 6.2.2 මාර්ගෝපදේශය | 765,868 | තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව සපුරා නොතිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 72,570 | වාහනවල අභ්‍යන්තර අළුත්වැඩියාවන්වලදී වාහනය කොටස්වලට ගැලවීමකින් තොරව ඇස්තමේන්තු ලබා ගැනීම හේතුවෙන් අමතර වැය දැරීමට සිදු වී තිබුණි. |
| (ඉ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 දරණ චක්‍රලේඛය | - | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.212,024,949 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.136,766,383 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බැංකු ගිණුම් 03 ක මාසික සැසඳුම් අනුව අවස්ථා 13 කදී රු.96,411 ක හඳුනා නොගත් ගෙවීම් පැවතුණි.

(ආ) බැංකු ගිණුම් 02 ක තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.34,509 ක් මාස 07 සිට වර්ෂ 06 ක කාලයක් තුළ නිරවුල් කරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් 03 ක වූ රු.5,290,452 ක සෘජු ප්‍රේෂණ 41 ක් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 160,900 | 167,197 | 162,305 | 85,347 | 146,100 | 154,229 | 159,745 | 80,455 |
| (ii) බදු කුලී | 80,630 | 71,123 | 67,977 | 16,139 | 96,513 | 76,284 | 68,580 | 12,994 |
| (iii) බලපත්‍ර ගාස්තු | 14,705 | 15,914 | 15,914 | - | 10,705 | 10,520 | 10,520 | - |
| (iv) වෙනත් ආදායම් | 413,147 | 336,470 | 268,771 | 99,540 | 402,163 | 295,100 | 292,174 | 31,842 |
| එකතුව | 669,382 | 590,704 | 514,967 | 201,026 | 655,481 | 536,133 | 531,019 | 125,291 |

සටහන

2016 සහ 2017 වර්ෂවල රැස්කළ ආදායම් තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟහිටි ලැබීම්ද ඇතුළත්ව තිබුණි.

## 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රුපියල් මිලියන 590 කින් සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායම් රුපියල් මිලියන 125 කින් වර්ෂය තුළ රුපියල් මිලියන 515 ක් අයකරගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 125 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විට රුපියල් මිලියන 201 ක් දක්වා වර්ධනයවී තිබුණි.

## 2.3.3 වරිපනම් හා බදු

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම් කොට්ඨාස 12 ක වරිපනම් ඒකක 14,416 ක බිල්කළ ආදායම රු.77,512,545 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට රු.44,155,880 ක් වූ හිඟයෙන් රු.33,094,423 ක් වර්ෂ 01 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂ විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.37,964,657 ක් වූ හිඟ ජල ආදායමෙන් රු.100,000 කට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝජකයින් 19 දෙනෙකුගේ ශේෂය රු.4,544,660 ක් විය.

## 2.3.4 කුලී

-----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලොතරැයි කුටි කුලී හා සංචාරක කුලී අයකර ගැනීම මන්දගාමී වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,892,646 ක හිඟයක් පැවතුණි.

(ආ) කුරුණෑගල නව සාප්පු සංකීර්ණයේ කඩ කාමර 57 කින් රු.706,500 ක කඩ කුලී හා රු.360,845 ක සේවා ගාස්තු හිඟයක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කුරුණෑගල බස් නැවතුම්පොළ කඩ කාමර 62 කින් හිඟ කුලිය රු.1,160,581 ක් සහ පෙර ගෙවුම් මුදල් රු.355,880 ක් අයකරගත යුතුව පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට රජපිහිල්ල හා රන්තලිය තානායම්වලින් රු.6,105,427 ක කුලී අයකර ගතයුතුව තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට උමං මාර්ග සාප්පු සංකීර්ණය සහ පොදු වෙළඳපොල හා අනෙකුත් කඩ කුලී ලෙස පිළිවෙලින් රු.70,000 ක් සහ රු.1,614,650 ක් අයකරගත යුතුව පැවතුණි.

## 2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංචාරක කුලී හා ලොතරැයි කුටි සඳහා ප්‍රමාද ගාස්තු රු.489,265 ක් අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ශුනාගාර ගාස්තු රු.185,750 ක් අයවිය යුතුව පැවතුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.2,915,202 ක් හා රු.77,729,187 ක් අයකරගත යුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යය සාධනය**

**-------------------**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටු කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා 53 ක් හා ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/40 හා 2015 සැප්තැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා 01ක් මහා නගර සභාව විසින් වැළඳගෙන තිබුණු අතර සභාව විසින් අතුරු ව්‍යවස්ථා 07 ක් පනවාගෙන තිබුණි.

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

------------------------------

2017 වර්ෂයට අයවැයගත කර තිබුණු රු.68,450,000 ක් වූ කර්මාන්ත 66 ක් ඉටුකර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය

(i) දෛනිකව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට කසළ කිලෝ ග්‍රෑම් 44,500 ක පමණ ප්‍රමාණයක් රැස් කරන අතර, සමාලෝචිත වර්ෂයේදී කසළ කිලෝ ග්‍රෑම් 436,080 ක් යොදාගෙන පොහොර කිලෝ ග්‍රෑම් 27,255 ක් නිෂ්පාදනය කර තිබුණි.

(ii) සුන්දරාපොළ පිහිටි කසළ මධ්‍යස්ථානයේ දිරන හා නොදිරන ලෙස වර්ගීකරණය නොකරන ලද විශාල කසළ කන්දක් පැවතුණ අතර, එය පරිසර ව්‍යසනයකට හේතුවෙමින් පැවතුණි.

(iii) සණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල නිරතවන සේවකයන්ට පිරිසිදු කාරක ද්‍රව්‍ය හා සනීපාරක්ෂක උපකරණ සමාලෝචිත වර්ෂයේදී ලබා දී නොතිබුණු බව 2018 ජූලි 19 දින භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) පාරිසරික ගැටළු

-------------------

නාගරික බල සීමාවේ තිබෙන වාන් ඇල මාර්ගය මෙන්ම අනෙකුත් කාණු පද්ධති කැලි කසළ හා ප්ලාස්ටික් බෝතල් හේතුවෙන් අපිරිසිදුවී තිබුණු අතර, ඒ පිළිබඳව සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර, දිළිඳුබව පිටු දැකීම අරමුණු කරගෙන සභාව විසින් වැන්දඹු අනත්දරු දීමනා ලබාදීම, ස්වයං රැකියා සඳහා කාන්තා අභිවෘද්ධි ප්‍රවර්ධන වැඩසටහන් හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ ගණනාවක සිට දැක්වෙන රු.749,389 ක වැටුප් අත්තිකාරම් හා රු.1,245,414 ක ආහාර දීමනා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ලදුපත්වල අනු පිටපතක් නොවූ අතර, එහි උප පත්‍රිකාවල අදාල විස්තර සඳහන් කර නොතිබීම හේතුවෙන් අයකරනු ලබන ගාස්තු වාහන වර්ග අනුව නිවැරදිද යන්න තහවුරු නොවීය.

(ඇ) රජයේ නිවාස සඳහා ආර්ථික කුලී අයකරන්නේ නම් 2004 ජූලි 15 දිනැති අංක එෆ්සී/2/2005 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ උපදෙස් පරිදි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරුවක් ලබාගෙන ඒ අනුව ආර්ථික කුලී අය කළයුතු නමුත් සභාව සතු සියළුම රජයේ නිවාසවලින් 2000 පෙබරවාරි 21 දිනැති තක්සේරුවක් මත පදනම්ව කුලී අයකර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

-----------------------------------

(i) සමාලෝචිත වර්ෂය අවසානයට මහා නගර සභාවේ ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීක සහ ප්‍රාථමික තනතුරුවල පිළිවෙලින් 04 ක්, 02 ක්, 35 ක් සහ 71 ක් වශයෙන් පුරප්පාඩු පැවති අතර ප්‍රාථමික තනතුරු 02 ක අතිරික්ත 10 ක් පැවතුණි. තවද පෙර පාසැල් ගුරුවරුන් ලෙස 05 ක් සහ ප්‍රාථමික තනතුරු 03 ක් සඳහා 17 ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන තිබුණු අතර, ප්‍රාථමික තනතුරු 05 ක අනියම් සේවකයින් 35 ක් සේවයේ යොදවාගෙන තිබුණි.

(ii) කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතුවලට දිනකට අවම වශයෙන් සේවකයන් 34 දෙනෙකු අවශ්‍ය වුවත්, සේවකයින් 14 දෙනෙකු පමණක් සේවයේ නිරතව සිටින බව 2018 ජූලි 19 දින ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) සේවක ණය

---------------

ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා මියගිය 30 දෙනෙකුගෙන් එකතුව 1,518,729 ක් අයකරගත යුතුව පැවතුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල මනු සවි කිරීම සඳහා වූ ඉල්ලීම් ඉටු කිරීමේ වර්ෂ ගණනාවක කාල ප්‍රමාදයක් පැවතුණි.

(ආ) රජපිහිල්ල තානායම බදු දීමට අදාළව අවම සුදුසුකම් තහවුරු කර ගැනීමකින් තොරව 2015 ඔක්තෝබර් 15 දින සිට වර්ෂ 10 කට බදු දී තිබුණද, 2016 නොවැම්බර් 10 දින වන විටත් ව්‍යාපාර කටයුතු ආරම්භ නොකිරීම හා බදු කුලී (බදු හා දඩ සහිතව) රු.8,474,084 ක් නොගෙවීම මත ගිවිසුම අවලංගු කර තිබුණි. එහෙත් මේ සඳහා උසාවියේ නඩු කටයුතු පැවතීම හේතුවෙන් අදාළ දේපල පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්නා සාප්පු හා කාර්යාල සංකීර්ණ 07 කින් 2015 සැප්තැම්බර් 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 11.(VI) උපවගන්තිය පරිදි ගාස්තු අයකර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

**--------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ III.15(2) ප්‍රකාරව එක් එක් ප්‍රධාන නිලධාරියා විසින්, තමන්ගේ දෙපාර්තමේන්තුව ඇතුළත හෝ තමන්ගේ පාලනය යටතේ ඇති වාහන සහ යන්ත්‍රෝපකරණ, මෙවලම්, කාර්යාලවල සහ ගොඩනැගිලි තුළ ඇති ද්‍රව්‍ය පිළිබඳව ප්‍රමාණවත් විස්තර පෙන්නුම් කරන පරිදි ලේඛන පවත්වාගත යුතු වුවත්, සභාව විසින් පවත්වාගෙන යන එම ලේඛනවල වටිනාකම් සඳහන් කර නොතිබුණි.

**3.5.2 පවරා නොගත් වත්කම්.**

**------------------------**

ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් 2013 ජූලි 03 දින සභාවට ලැබී තිබුණු මෝටර් කාර් රථය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5.3 නිශ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්**

**------------------------------------**

සභාව සතු වාහන 10 ක් අබලන්වීම මත නිශ්ක්‍රීයව පැවති අතර, නිල නිවාස 09 ක් අභාවිතව පැවතුණි.

**3.5.4 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණ**

**---------------------------------**

2017 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 ජූනි 18 දින වන විටද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**---------------**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම.**

**------------------------**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.6.2 සැපයීම් හා සේවා**

**-------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) සහ (ඇ) ප්‍රකාරව පිරිවිතර ඉදිරිපත් කිරීමකින් තොරව, ජලනල හා උපාංග සඳහා යොදා ගන්නා එස්ලෝන් වර්ගයේ නිෂ්පාදන විෂයයන් 07 කට අදාළව ඒකක 1,075 ක් රු.985,750 කට මිලදීගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 හි සඳහන් අවස්ථානුගත කරුණුවලදී නැවත ඇණවුම් කිරීම සඳහා බලයක් නොමැතිව රු.325,000 ක් වූ ½" ජලමනු 100 ක් නැවත ඇණවුම් කර මිලදීගෙන තිබුණි.

(ඇ) ගබඩාවේ බින්කාඩ් අනුව සමාලෝචිත වර්ෂයේදී ජලමනු 292 ක් නිකුත් කර 247 ක් සවිකර තිබීමෙන් ජලමනු 45 ක වෙනසක් පැවතුණි.

(ඇ) ලීටර් 1,000 සහ ලීටර් 500 පිළිවෙලින් ජල ටැංකි 02 ක් හා ජල ටැංකි 11 ක් රු.75,929 කට මිලදීගෙන තිබුණු අතර, වර්ෂ 10 ක වගකීම් සහිත අවම මිල ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වා නොතිබුණි.

**3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

පොදු සුසාන භූමියේ පැරණි ආදාහනාගාරය පිළිසකර කිරීමට ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන ආයතනයේ ලියාපදිංචි C9 කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවකු විසින් සිදුකළයුතු වුවද, කාණ්ඩය සඳහන් නොකළ කොන්ත්‍රාත්කරුවෙකුට ටෙන්ඩරය පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි11 දිනදී ය.

### 4.2 අයවැය පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 05 ක හා වියදම් විෂයයන් 05 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 12 සිට සියයට 89 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයන් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අයවැය කර නොතිබුණු මාර්ග 02 ක් රු.4,600,000 කින් ප්‍රතිසංස්කරණය කර තිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

---------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ III කොටසේ 13 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ----------- | ------------ |
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් නිවැරදි ලෙස ගිණුම්ගත කර නොතිබීම.<br>(ii) අත්තිකාරම් ශේෂයන් වරදවා දැක්වීම.<br>(iii) ජංගම වත්කම්/ වගකීම් නිසි පරිදි ගිණුම් ගත කර නොතිබීම.<br>(iv) ජංගම නොවන වගකීම් ගිණුම්ගත නොකිරීම.<br>(v) තැන්පතු ශේෂ වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>(vi) ආදායම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| (ආ) ආදායම් පාලනය | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | (i) | වත්කම් ලේඛනගත නොකිරීම. |
| | (ii) | වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| | (iii) | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| | (iv) | නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| | (v) | වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණ සිදු නොකිරීම. |
| (ඇ) ප්‍රසම්පාදන | (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු නොකිරීම. |
| | (ii) | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකිරීම. |
| (ඉ) අයවැය පාලනය | (i) | ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර ප්‍රමාණාත්මක විචලනයන් පැවතීම. |
| | (ii) | අයවැයගත කර්මාන්ත ඉටු නොකිරීම. |
| (ඊ) සේවක කළමනාකරණය | (i) | පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම. |
| | (ii) | හිඟහිටි සේවක ණය අය කිරීමට කටයුතු නොකිරීම. |
| (උ) ණයගැති/ණයහිමි පාලන | (i) | උපලේඛන පිළියෙල නොකිරීම. |
| | (ii) | කාලවිශ්ලේෂණ පිළියෙල නොකිරීම. |